**දඹුල්ල මහා නගර සභාව - 2021**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 අහිතකර මතය
**-----------------**

දඹුල්ල මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම
**--------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**----------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,000,000 ක් වටිනා ඉඩම් කට්ටි 03 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ද්විගණනය වීම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | ආදායම් වියදම් ගිණුමෙන් ලියාහැර තිබුණු වත්කම් වල අගයට නැවත ක්ෂය වෙන්කිරීම නිසා රු.33,466,805 ක ක්ෂය වියදම් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ක්ෂය ගැලපීම නිවැරදි කරමි. | වත්කම් අගය ආදායම් වියදම් ගිණුමෙන් ලියාහරින බැවින් නැවත ක්ෂය වෙන් කිරීමක් අවශ්‍ය නොවේ. |
| (ඇ) | ප්‍රාග්ධන වියදම් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ප්‍රතිපූර්ණ මුදල රු. 10,429,918 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,532,400 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක් සහ රු.1,044,620 ක ගෙවිය යුතු ගිණුම් ශේෂය විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | පිළිගනිමි.අදාළ ලේඛන නැවත පරීක්ෂා කර බලා ඉදිරි වර්ෂයේ දී නිවරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි | අනුමැතිය ලැබීමෙන් පසු ගිණුම් වලට ගැලපිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.46,969,866 ක වත්කම් විෂයන් 09 ක්ද රු.219,678,864 ක බැරකම් විෂයයක්ද රු.767,009 ක ආදායම් විෂයයක්ද රු.491,532 ක වියදම් විෂයයන් 14 ක වටිනාකම් ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | පිළිගනිමි.ඉදිරි වර්ෂයේදී ගැලපීමට කටයුතු කරමි | සියළු විෂයයන්ගේ වර්ෂයට අදාළ ගණුදෙනු හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුනු ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 27 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම සහ අනුරූපි වාර්තා අනුව වටිනාකම අතර රු.63,990,523 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරගැනීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් සටහන් නිවැරදි කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 40(1) උපවගන්තිය | ගිවිසුමකට එළඹීමකින් තොරව කඩ කාමර 68 ක් බාහිර පාර්ශවයන්ට ලබාදී තිබුණි. | ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. | 40(1) උ වගන්තියට අනුව කටයුතු කළ යුතුය. |

**1.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපතිගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ලෙස 08 දෙනෙකු බඳවාගෙන රු.2,761,000 ක දීමනා ගෙවීම් කර තිබුණි. | ආණ්ඩුකාර අනුමැතිය නොමැති බව පිළිගනිමි. | ආණ්ඩුකාර අනුමැතිය ලබාගැනිමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.13,485,175 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.19,286,030 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

දඹුල්ල මහා නගර සභාව විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමේ ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබියදී වියදම් දැරීම නිසා බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් මාසිකව අයිරා පොලී ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව 2019 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු.762,308 ක හා රු.970,829 ක ද, සමාලෝචිත වර්ෂයේදී රු.1,704,091 කද අයිරා පොලී ගෙවා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයන් අවසානයට සමස්ථ ආදායම් හිඟය පිළිවෙලින් රු.34,180,764 ක් හා රු.53,884,471 ක් වූයෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි. හිඟ ආදායම් වලින් සමාලෝචිත වර්ෂයේ | පිළිතුරු සපයා නොමැත. | හිග ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයකරගෙන තිබුණේ රු.7,019,092 ක් හෙවත් හිඟයෙන් සියයට 21 ක් පමණි. | | |
| (ආ) | 2011 වර්ෂයේ කරන ලද තක්සේරුව මත වරිපනම් ඒකක 2795 කින් සමාලෝචිත වර්ෂයේද වරිපනම් ගාස්තු අයකරමින් පැවතුණි. සමීක්ෂණ වලින් නව වරිපනම් ඒකක 1897 හඳුනාගෙන තිබුණු අතර ඒ සියල්ල නැවත තක්සේරු කර වරිපනම් ආදායම් අයකරගෙන නොතිබුණි. | තක්සේරු ප්‍රතිශෝධන කටයුතු 2022 ජනවාරි මස සිට සිදුකළ අතර මේ වන විට එම කටයුතු තාවකාලිකව නවතා ඇති බවත්,එම කටයුතු නැවත ආරම්භ කර වරිපනම් ආදායම වැඩිකර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි | සියළු වරිපනම් ඒකක නැවත තක්සේරු කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දඹුල්ල බස්නැවතුම්පල කඩ කාමර 103 කින් තොගපොල කඩ කාමර 81 කින් හා විහාර හන්දිය කඩ කාමර 10 කින් ඇතුළුව කඩ කාමර 194 කින් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 31 දිනවන විට බදු ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු මුළු හිඟ කඩකාමර කුලිය රු.7,614,738 ක් අයකර නොතිබුණි. | 2021.08.31 දිනට පැවති රු.7,614,737.51 ක් වූ හිඟ මුදලින් 2021.09.01 සිට 2022.01.12 වන දින වන වි රු. 3,115,981.37 මුදලක් අයකර ගෙන ඇති අතර හිඟ මුදල් නොගෙවීම මත කඩ කාමර මුද්‍ර තැබිමද සිදු කර ඇත | හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දඹුල්ල බස්නැවතුම්පල කඩ කාමර 05 ක් එක් කර තනි ඒකකයක් ලෙස සංවර්ධනය කර බදුදිම සඳහා වූ ගිවිසුම් පත්‍රයෙහි ඉදිකිරීම අවසන් කළ යුතු දිනය දක්වා නොතිබුණු අතර ගිවිසුම අත්සන් කළ දිනය වූ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 04 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් සභාවට අයකරගත යුතු කුලී අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | රටේ පැවති අයහපත් වසංගත තත්වය හේතුවෙන් 2021.04.30 දින සිට 2021.06.30 දින දක්වා පනවන ලද සංචරණ සීමා නිසා මෙම වැඩ කාර්යය නියමිත කාලය තුළ නිම කිරීමට නොහැකි විය. ඉදිරියේ දී බදුකරු මාර්ගයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි | ඉදිකිරීම් අවසන් කල යුතු දිනය ගිවිසුම්ගතව නොතිබීම නිසා ගිවිසුමේ 2(I) කොන්දේසියට අනුව කටයුතු කර කුලි මුදල් අයකරගත යුතුවේ. |
| (ඉ) | දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් මහා නගර සභාවට භාරදෙන ලද කඩ කාමර 73 ක් සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණද, මහා නගර සභාව බාහිර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ලිපි මඟින් මෙන්ම වාචිකවද, දැනුම්දීම් සිදු කළ අතර බදුකරුවන් සියලු දෙනා ඊට ප්‍රතිචාරයක් නොදැක් වූ අතර අවම වශයෙන් ගිවිසුම් සකස් කිරීමට අදාල ලියවිලි ද,ඉදිරිපත් නොකරන ලදි. | බාහිර පාර්ශවය සමඟ නව ගිවිසුම් වලට එළඹිය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බස්නැවතුම්පළ කඩ කාමර 17 කට අදාළ රු.2,896,495 ක හිඟ ටෙන්ඩර් ගාස්තු අයකර නොතිබුණු අතර මෙම සම්පූර්ණ හිඟ මුදලම ඉකුත් වර්ෂවලට අදාළව පැවතුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන ක්‍රියාත්මක කරගැනීමට නොහැකි විය. පසුව හඳුනාගත් කඩ මුද්‍රා තබා හිඟ අය කර ගැනීමට කටයුතු කරමි. | හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.3.2 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 226(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.227,709 ක වටිනාකමකට වූ අධිභාර 02 ක් පනවා තිබුණි. ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.433,774 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | රු.225,065 ක මුදලට අදාළව එක් අධිභාරලාභියෙකු විසින් සහ රු.227,709 ක මුදලට අදාළව තවත් අධිභාරලාභියෙකු විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂි පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු සීමාව ඉක්මවා රු.9,060,000 ක වාහන හා යන්ත්‍ර උපකරණ මිලදීගෙන තිබුණද ගිවිසුම් කොන්දේසි අනුව ව්‍යාපෘති කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි. | ඩොලරයේ අගය ඉහළ යෑම නිසා වැඩිපුර ගෙවීමට සිදුවිය. | ව්‍යාපෘති කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතුව රු.95,238,842 ක් වූ අතර ඊට වසර 01 සිට 05 අතර කාල පරාසයකට අයත් ශේෂය රු.36,962,557 ක් ද වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පවතින ශේෂය රු.4,481,962 ක්ද ඇතුළත් වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.252,550,949 ක් වූ අතර ඊට වසර 01 ත් 05 ත් අතර කාල පරාසයකට ඇතුළත් ශේෂය රු.12,697,272 ක් ද වසර 05 කට වැඩි කාලයක් තිස්සේ පවතින ශේෂය රු.220,520,597 ක්ද ඇතුළත් වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගෙවිය යුතු ගිණුම් ශේෂ ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 50 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව 75 ක් විය. එසේ සෞඛ්‍ය කම්කරු තනතුරු 25 ක් වර්ෂ 03 ක් තුළ අතිරික්තව පැවතියදී 2019, 2020 හා සමාලෝචිත වර්ෂවල විවිධ අවස්ථාවලදී කොන්ත්‍රාත් පදනම මත තවත් සෞඛ්‍ය කම්කරුවන් 56 දෙනෙකුද බඳවාගෙන වැටුප් ගෙවා තිබුණි. | ඉකුත් වර්ෂ වලදී මහා නගර සභාව විසින් සපයන සේවාවන් පුළුල් වීම හා දිගම්පතහ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු සඳහාත් නගර සීමාවේ අපද්‍රව්‍ය ඉවත් කිරීම විධිමත් කිරීම වැනි කටයුතු සඳහා බඳවාගෙන ඇත. ඒ සඳහා මහා සභා අනුමැතිය ලැබී ඇත. | අනුමත කාර්ය මණ්ඩලයේ සීමාවන් අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභාවේ වාහන 04 කට අදාළව අනතුර සිදුවී වසර 02 සිට 04 අතර කාල පරාසයක් ගතවී තිබුණ ද අදාළ රක්ෂණ වන්දි මුදලින් ප්‍රතිපූර්ණය නොවූ රු.412,306 ක අලාභයක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර නොතිබුණි. | පරීක්ෂණය සඳහා කමිටුවක් පත් කර ඇත. | අලාභ අයකර ගැනීම කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාබනික කෘෂි පොහොර නිෂ්පාදනය ව්‍යාපෘතිය සඳහා සිදුකළ මිලදී ගැනීම් වලදී අදාළ උපකරණ 2021 දෙසැම්බර් 31 දිනට භාරදීමට නොහැකි බව දක්වමින් අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබූ අතර එම දිනට සැපයිය හැකි බවට වැඩි අගයකට දන්වා තිබූ ලංසුකරුවන් තෝරාගෙන ලංසු ප්‍රධානය කිරීම නිසා නගර සභා අරමුදලට රු.4,866,000 ක අලාභයක් සිදුවී තිබුණි. දෙසැම්බර් 31 දිනට එම උපකරණ සියල්ල ලැබී නොතිබුණු අතර අදාළ ව්‍යාපෘතිය 2022 මැයි 19 දින වන විටද ආරම්භ කර නොතිබුණි. | අවම මිල ඉදිරිපත් කළ ආයතනයට නියමිත දිනට සැපයීම සිදුකළ නොහැකි නිසාත් 2021.12.31 දිනට පෙර ව්‍යාපෘතිය අවසන් කළ යුතු නිසාත් එලෙස කටයුතු කළ හැකි ආයතනයකින් මිලදී ගැනීම සිදුකරන ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබුණද 2022 මාර්තු 31 දින වන විට කාරණා 10 ක් වෙනුවෙන් සකස් කර තිබූ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | ගැසට් පත්‍රය පළ කිරීමට කටයුතු කරමින් පවතී. | මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවට කසළ දාහක යන්ත්‍රයක් රු.13,250,000 කට මිලදී ගැනීමට ප්‍රසම්පාදනයෙන් තෝරාගත් සැපයුම්කරු සහා තීරණයන් මත ප්‍රතික්ෂේප කර තිබුණි. පූර්ව කාර්ය සාධන ඉදිරිපත් නොකළ හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව දෙවන සැපයුම්කරු සහා තීරණයන් මත තෝරාගැනීම නිසා පළමු සැපයුම්කරුගේ මිලට වඩා රු.6,168,615 ක් වැඩියෙන් ගෙවීම්කර තිබුණු අතර ටෙන්ඩර් කොන්දේසි 08 ක් කඩකරමින් රු.මිලියන 19.4 ක නව කසළ දාහකය මිලදීගෙන තිබුණි. ගිවිසුම් කාලය ඉක්මවීමටද මත්තෙන් විශාල අලුත්වැඩියාවන්ට ලක්ව මෙම දාහකය අබලන්ව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 18 දින සිට දාහකය සම්පූර්ණයෙන්ම ක්‍රියාවිරහිත වී තිබුණ ද එය අලුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි. | අළුත්වැඩියාව සිදු කොට භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් කාලය ඉක්මවා නොමැති නිසා සැපයුම්කරු ලවා අලුත්වැඩියා කරගෙන භාවිතයේ යෙදවිය යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු 17 කට අදාළ ඉලක්ක නිර්ණායක හා වැඩසටහන් තෝරාගෙන ක්‍රියාත්මක කිරීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | අරමුණු වලට අනුව කටයුතු කරමින් පවතී. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුව කටයුතු කළ යුතුය. |